සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security - Social Security Division

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ....................
දිනය / திகதி / Date: 2020.03.02

**සමෘද්ධි ප්‍රජා මූල බැංකු චක්‍රලේඛ අංක :- 2020/02**

**සියළුම සමෘද්ධි ප්‍රජා මූල බැංකු කළමණාකරුවන්/ බැංකු සමිති කළමණාකරුවන්,**

**2020 මාර්තු 08 දින ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව දිරියමාතා ඉතුරුම් තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන දියත් කිරීම - 2020**

**01. හැඳින්වීම.**

2020 මාර්තු 08 දිනට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනය සමරමින්, සමෘද්ධි ප්‍රජා මූල බැංකු විසින් දිරියමාතා ඉතුරුම් තැන්පතු ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කිරීමට අපේක්ෂා කරයි.

දිරිය කාන්තාව / ගෘහණිය විසින් ගෘහය හා සමාජයට සකසුරුවම පිළිබඳ ආදර්ශ ලබාදෙන අතර, එම ආදර්ශය තවදුරටත් පෝෂණය කරමින්, මුදල් ඉතුරුම් පුරුද්ද ශක්තිමත්ව ඉදිරියට ගෙන යමින්, ඔවුන්ගේ ආර්ථික තත්වය ශක්තිමත් කිරීමටත්, එහි ප්‍රතිඵලයක් ලෙස උපදින ප්‍රතිලාභ රටෙහි සංවර්ධනයට යොමු කිරීමට අපේක්ෂා කරයි.

එම අරමුණු උදෙසා දැනටමත් සමෘද්ධි බැංකුව වටා ඒකරාශී වී ඇති කාන්තාවන් මෙන්ම ගොනු වී නොමැති කතුන් වෙනුවෙන් දිරියමාතා ඉතුරුම් ගිණුම් වලට මුදල් තැන්පත් කිරීමත්, නව දිරියමාතා ගිණුම් ආරම්භ කිරීමට පෙළඹවීමත් මෙම ප්‍රවර්ධන වැඩසටහනින් අපේක්ෂා කරමු.

02. ජාත්‍යන්තර කාන්තා දිනය අළලා සිදුකරන, දිරියාමාත ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ දිරියමාතා ගිණුම් හිමියන් ඇතුළු බැංකු බල ප්‍රදේශය කාන්තාවන් දැනුවත් කර ඉතිරි කිරීමට යොමු කළ යුතු බවත්, සමෘද්ධි ප්‍රජා මූල බැංකු සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය විසින් උපදෙස් දුන් අතර, මෙම වර්ෂයේදී බැංකුවට හෝ වසමට ඉලක්කයක් ලබාදීමද සිදු නොකරන බව දන්වමි.

**03. ප්‍රවර්ධන වැඩසටහනෙහි කාල සීමාව**

3.1. 2020 මාර්තු 08 දින සිට 14 දක්වා කාලසීමාව තුළ ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන දියත් කෙරේ.

3.2. මෙහිදී සමෘද්ධිලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන්ට කිසිදු බලපෑමක් හෝ දුෂ්කරතාවයක් ඇති නොකර තැන්පතු රැස්කිරීම සිදුකළ යුතුය.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office 0112872202 |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | Hot Line: 011- 2887722 |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | |
| | | Hot Line :0112-889007 | | | |

**04.** ඉතුරුම් ප්‍රවර්ධන කාලය තුළ දිරියමාතා ගිණුම් සඳහා මුදල් තැන්පත් කරන ගිණුම්හිමියන්ට සමෘද්ධි ප්‍රජා මූල බැංකු චක්‍රලේඛ අංක 2019/01 හී ඡේද අංක 4.3 හි සඳහන් පරිදි තිළිණයන් ලබාදීමට ද කටයුතු කළයුතුය.

05. මෙම වැඩසටහන යටතේ ප්‍රගතිය, දිස්ත්‍රික් සමෘද්ධි අංශය විසින් 2020.04.01 වන දිනට පෙර bank@samurdhi.gov.lk විද්‍යුත් ලිපිනය හරහා ක්ෂුද්‍ර මූල්‍ය අංශයට එවිය යුතුය.

06. අනෙකුත් කරුණු සඳහා 2019/01 චක්‍රලේඛ උපදෙස් තවදුරටත් වලංගු කරගත යුතුයි.

**ආර්. පි. බි. තිලකසිරි**
**අධ්‍යක්ෂ ජනරාල්**

පිටපත්:-

| | |
|---|---|
| 01. ලේකම් - කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය. | - කා.දැ.ස. |
| 02. ලේකම් - සමාජ ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය. | - කා.දැ.ස |
| 03. සියළුම දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. | - කා.දැ.ස. |
| 04. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. | - කා.දැ.ස. |
| 05. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. | - දැ.ස. හා අ.ක.ස. |
| 06. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. | - කා.දැ.ස. |
| 07. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. | - කා.දැ.ස. |
| 08. සියළුම අධ්‍යක්ෂවරුන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. | - කා.දැ.ස. |
| 09. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. | - කා.දැ.ස. |
| 10. සියළුම සභාපතිවරුන්, විධායක කමිටු - ප්‍රජාමූල බැංකු සමිති. | - දැ.ගැ.ස හා අ.ක.ස. |
| 11. සියළුම සභාපතිවරුන්, පාලක මණ්ඩල - ප්‍රජාමූල බැංකු. | - දැ.ගැ.ස හා අ.ක.ස. |